# පාසල් අධීක්ෂණය

**මිනුවන්ගොඩ ඤාණාවාස හිමි**

## හැඳින්වීම

අධ්‍යාපනයේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හුදෙක් අධ්‍යාපන සේවා සැපයීම පමණක් ප්‍රමාණවත් නොවේ.ඒ සඳහා වන වෙනත් කළමනාකරණ ක්‍රියාකාරකම් සහ මැදිහත්වීම් ද තහවුරු කළ යුතුය. එහිලා පාසල් අධීක්ෂණය අත්‍යවශ්‍ය අධ්‍යාපන කළමනාකරණ පාලන යාන්ත්‍රණයක් හෙවත් කුළුණක් (pillar) වන අතර එමගින් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු උපරිම ලෙස සාක්ෂාත් කර ගැනීම සහතික කෙරේ. සැබැවින්ම, ප්‍රමාණවත් අධීක්ෂණයක් හෝ අධීක්ෂණ උපාය මාර්ගයක් නොමැතිව පාසල් පරිපාලනය සාර්ථක කර ගත නොහැක. මක් නිසාද යත්; පාසලේ දෛනික කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා සාමාන්‍ය කාර්ය මණ්ඩලයක මූලිකත්වය හා දක්ෂතාව ප්‍රමාණවත් නොවේ. එම නිසා සෑම කළමනාකරුවෙකුම ආයතනයේ දෛනික කාර්යය ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීම සඳහා උපදෙස් හා තාක්ෂණික හෝ වෘත්තීයමය උපකාර කිරිම මගින්සිය කාර්ය මණ්ඩල දැනුවත්භාවය නිරන්තරව ඉහළ නැංවීමඅපේක්ෂා කෙරේ. එබැවින්, ගුරුවරුන්, පංති කාමර, පුස්තකාල, විද්‍යාගාර, පෙළපොත්, අරමුදල් ආදිය ප්‍රමාණවත් ලෙස ලබා දීම



හැරුණු විට ඵලදායී පාසල් අධීක්ෂණයකින් තොරව ඵලදායී පාසල් කළමනාකරණය සහතික කළ නොහැකිය. මෙහි දී පාසල් අධීක්ෂණය, පාසල් අධීක්ෂණයේ අවශ්‍යතාව, පාසල් අධීක්ෂණයේ මූලික ලක්ෂණ, පාසල් අධීක්ෂණ විධික්‍රම, අධීක්ෂකවරයා සහ අධීක්ෂණ කුසලතා, සහ තදනුබද්ධ සංකල්ප විවරණය කෙරේ.

## පාසල් අධීක්ෂණය

"අධීක්ෂණය යනු කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමයි. කැරොල්. එම් **(2007)** නිර්වචනය කරන ආකාරයට අධීක්ෂණය යනු අධීක්ෂණයට ලක් වන්නා තමාගේ ම ක්‍රියාකාරකම් තක්සේරු කිරීමෙන් සහ කාර්ය සමාලෝචනය කිරීමෙන් වඩාත් හොඳ දේ කිරීම සඳහා සිදු සිදුකරනු ලබන ක්‍රියාවලියකි. එම ක්‍රියාවලියේ දී ගුරු අභිප්‍රේරණය වර්ධනය කිරීමට මෙන්ම වඩා ඵලදායි ඉගෙනුම් අත්දැකීම් නිර්මාණය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දේ. ඒ අනුව පාසල් අධීක්ෂණය යනු ශිෂ්‍යයන් සමග කටයුතු කරන ගුරුවරුන්ගේ සහ සහායක කාර්ය මණ්ඩලයේ සංවර්ධනය පිණිස ඔවුන් සමග එක්ව සිදුකරන උපදේශාත්මක ක්‍රියාවලියකි (**Chike-Okoli 2016**). එය පාසලේ හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ අත්දැකීම් සහිත ප්‍රවීනයන් විසින් පාසල් කාර්යයන් වඩා යහපත් ලෙස කරගෙනයාම සඳහා පාසල් කාර්ය මණ්ඩලය සමග එකට එකතු වී සිදු කරනු ලබන කාර්ය සමාලෝචනයක් ලෙස ද හැඳින්විය හැකිය. ඩෙනිස් එසියුසෝ (2014) අධීක්ෂණය හඳුන්වා ඇත්තේ ගුරුවරුන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ට වැඩි නිපුණතාවක් ලබා ගැනීමටත්, ඇතැම් බාධක මඟහරවා ගැනීමටත් අවශ්‍ය නායකත්වය සැපයීමේ ක්‍රියාවලියක් ලෙස ය. ඔගුණුගේ **(2000)** ට අනුව අධීක්ෂණය යනු අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගුරුවරුන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් වන අතර එහී දී පාසල් කාර්ය මණ්ඩලය පිළිගත් අධ්‍යාපන මූලධර්මවලට අනුකූල ද යන්න තහවුරු කර ගැනීම ද සිදු වේ.

හිතකර පාසල් අධීක්ෂණයක් පාසලෙහි ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම පැවැරෙන්නේ එම පාසලෙහි විදුහල්පතිවරයාටය.

පාසලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා විදුහල්පතිවරයා විසින් කළ යුතු ප්‍රධාන කාර්යක් ලෙස අධීක්ෂණය සැලකේ. මෙය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා විදුහල්පතිවරු පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණයෙන් සිය අධීක්ෂණ පුරුදු සහ ශක්‍යතා වැඩිදියුණු කර ගැනීමට පුහුණු විය යුතුය. බබයෙමි (2006) ට අනුව පාසලක විදුහල්පතිවරයෙකු පරිපාලන ක්‍රියා පිළිබඳව පුහුණුව ලබා ගැනීම පමණක් නොව පරිපාලන ක්‍රියාවලීන් මෙහෙයවීමේ හා පාලනය කිරීමේ මූලධර්ම ද හොඳින් දැන සිටිය යුතු ය. තමා මෙන් ම අධීක්ෂණ කාර්යයට සිය කාර්ය මණ්ඩලයේ ප්‍රවීණයන් පුහුණු කිරීම ද සිදු කළ යුතුය. ඵලදායි ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලියක් මගින් අධ්‍යපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධීක්ෂණ කාර්යයයෙහි උපරිම උත්සාහයක් දැරීමට ඔවුන්ව පොලඹවා ගැනීම ද ප්‍රධාන විධායක නිලධාරියෙකු වශයෙන් විදුහල්පතිවරයාගේ වගකීමකි.

## පාසල් අධීක්‍ෂණයේ අවශ්‍යතාව

පාසල් අධීක්‍ෂණයේ මූලික අරමුණ වන්නේ පාසලේ අධ්‍යයන හා අනධ්‍යයන අංගයන්හි කාර්යක්ෂමතාව සහතික කරමින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට හිතකර වාතාවරණයක් නිර්මාණය කිරීම හා පවත්වාගෙනයාමට හැකි වන අතර එය පාසල් පද්ධතියෙහි සමස්ත ඵලදායීත්වයට මනා රුකුලක් වේ. කෙසේ වෙතත් පාසල් අධීක්‍ෂණයේ අරමුණු රාශියක් දැකිය හැකිය. ඒ අනුව විශ්ව මූලික අධ්‍යාපන වැඩසටහන් අත්පොතෙහි Universal Basic Education (UBE) programme) පාසල් අධීක්ෂණය සඳහා මුල් වන අරමුණු කිහිපයක් පහත පරිදි සඳහන් කර ඇත.

1. ගුරුවරුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීමපිණිසඃඑදිනෙදා ජීවිතයේ මෙන්ම ගුරු වෘත්තියෙහි ඇති විවිධ අභියෝග නිසා ගුරුවරයාගේ වෘත්තීය අවධානය සහ ස්වයං අභිප්‍රේරණය අඩු වීම ස්වභාවිකය. එහෙයින් අධීක්ෂණ කාර්යයේ දී ගුරුවරයා අභිප්‍රේරණය කිරීම සිදුවිය යුතුය.
2. ගුරුවරයාගේ හැකියා සහ විභවතා හඳුනාගැනීම පිණිසඃඑක් එක් ගුරුවරයාගේ පුහුණු අවශ්‍යතා ඉටුකිරීම, ස්ථානගත කිරීම්,



උසස්වීම් සහ සාමාන්‍ය රැකියා විස්තර පිළිබඳව කළමනාකරුට තාක්‍ෂණික උපදෙස් ලබා දීම අධීක්‍ෂකවරයාගේ කාර්යයකි. ඒ සඳහා ගුරුවරයාගේ හැකියා සහ විභවතා හඳුනාගැනීම අධීක්‍ෂණයේ දී කළ හැකිය.

3. ගුරුවරුන්ට තාක්‍ෂණික ආධාර සැපයීමඃඉගැන්වීමේ හා ඉගෙනීමේ දුෂ්කරතා ඇති ප්‍රදේශවල පාසැල්වලට හා ගුරුවරුන්ට ඉගෙනුම් අත්දැකීම් නිර්මාණය කිරීමට සහ නවෝත්පාදක ක්‍රම ශිල්ප හඳුනාගැනීමට අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම සඳහා ගුරුවරයාට වඩා ජ්‍යෙෂ්ඨ සහ පළපුරුද්දක් ඇති ප්‍රවීණයන්ගේ සහය අධීක්‍ෂකණයේ දී ලබා ගත හැකිය.
4. අඛණ්ඩ පුහුණුව දිරිමත් කිරීම ඃඅධීක්ෂණ කාර්යයේ දී ගුරුවරුන්ගේ කුසලතා මෙන්ම දුර්වලතා හඳුනා ගැනීමෙන් පසු එකී දුර්වලතා මග හරවා ගැනීමටත්, කුසලතා වර්ධනය කර ගැනීමටත් එසේම ගුරු වෘත්තියට අදාළ වර්තමාන ප්‍රවණතා හඳුන්වා දීමටත් අවශ්‍ය වැඩමුළු, සම්මන්ත්‍රණ, සේවාස්ථ පුහුණු සැසි සහ වෘත්තීය දිශාගත කිරීම් පිණිස අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීමට අධීක්ෂකවරයාට අවකාශය සැලසේ.

5 ගුරුවරුන් තුළ වෘත්තීයභාවය පිළිබඳ ප්‍රබෝධය ප්‍රවර්ධනය කිරීමඃ පාසල් අධීක්ෂණයේ ප්‍රමුඛතම අරමුණ වන්නේ ගුරු වෘත්තියභාවය ඉහළ නැංවීමෙන් පාසලේ ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමයි.

6 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ආධාරක භාවිතය පිළිබඳ ගුරුවරයාට නිවැරදි අවබෝධයක් ඇති කිරීමඃපන්ති කාමරයේ ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා වඩාත් සුදුසු ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ තෝරාගැනීමට හා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය භාවිතයට ගැනීමට, ඒවා සැලසුම්කිරීමට හා ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට ගුරුවරයාට උපකාර කිරීම සඳහා පාසල් අධීක්ෂණය උපකාරී වේ.

මීට අමතරව චික්-ඔකොලි (2006) ද ගුරු සංවර්ධනය සඳහා වන පාසල් අධීක්ෂණයේ අරමුණු නමයක් (09)දක්වා තිබේ.

1. ගුරුවරුන්ගේ කාර්යයන්හි ඵලදායී බව සහතික කිරීම
2. ඔවුන්ගේ රැකියාවේ ඵලදායි ලෙස ක්‍රියා කිරීමට ඔවුන්ට ඉඩ සලසා දීම
3. ගුරුවරුන්ට වෘත්තීයමය තොරතුරු ලබා දීම
4. උපදෙස් ද්‍රව්‍ය (Instructional Intruments) ප්‍රභවයන් වෙත ගුරුවරුන්ට මග පෙන්වීම
5. ඉගැන්වීමේ උපකරණ සකස් කිරීම හා නිවැරදිභාවිතය සඳහා ගුරුවරුන්ට අවශ්‍ය තාක්‍ෂණික ආධාර ලබා දීම
6. පන්ති කාමරයේ විනය පවත්වාගෙන යන බවට සහතික වීම
7. ගුරුවරුන් අතර ඉහළ චිත්ත ධෛර්යයක් පවත්වා ගැනීම
8. ඉගැන්වීමේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ ක්‍රම යෝජනා කිරීම
9. විශේෂ හැකියාහෝ දක්ෂතා ඇති ගුරුවරුන් සොයා ගැනීමට අවස්ථාවක් ලබා දීම

ඉහත සාකච්ඡා කළ පරිදි පාසල් අධීක්ෂණය යනු ගුරුවරුන් සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්‍ෂණයකිරීම පමණක් ම නොවේ.එය අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලසහ අනෙකුත් පහසුකම් ඇතුළුව පාසලේ සෑම අංශයකම ගුණාත්මකභාවය සහතික කරන පාසල් වැඩිදියුණු කිරීමේ ව්‍යායාමයක් ලෙස හැඳින්වීම වඩා උචිතය. කළුලේ සහ බූචම්ම (2013) ගුරු අධීක්‍ෂණයට පරිබාහිර පාසල් අධීක්‍ෂණය සඳහා පහත සඳහන් අරමුණු ඉදිරිපත් කළහ.

1. පාසල්වල සාමාන්‍ය යහපැවැත්ම තීරණය කිරීම සඳහාඃ පාසල් මුහුණපාන විනයගැටලු, මූල්‍ය ගැටලු හෝ වෙනත් අධ්‍යාපන ගැටලු පිළිබඳව සොයා බැලීමට පාසල් අධීක්ෂණය උපකාරී වේ.
2. පාසල් පරිපාලනය වැඩි දියුණු කිරීමසඳහාඃවඩා හොඳ පාසල් පරිපාලනයක් පවත්වා ගැනීමට සහ පාසලේ ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස පාසල් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සඳහා පාසලේ අධීක්‍ෂණය මහොපකාරීවේ.



3. පිරිවැය/ප්‍රතිලාභ තීරණය කිරීම සඳහාඃ අධ්‍යාපනය ඕනෑම රටක ප්‍රධාන අයෝජනඅංශයක් වන අතර එයට විශාල වියදමක් ඇතුළත් වන බැවින් පිරිවැය/ප්‍රතිලාභ විශ්ලේෂණය කෙරෙහි නවීන පාසල් අධීක්ෂණයේ සමහර අංශ අවධානය යොමු කරයි.
4. ගුරුවරුන් සහ අධ්‍යාපන අමාත්‍යාංශය/ ඉහළ අධ්‍යාපන අධිකාරිය අතර ඇති පරතරය අඩු කිරීම සඳහා පාසල්වල බාහිර අධීක්ෂණයෙහි එක් අරමුණක් වන්නේ ගුරුවරුන් සහ ඉහළ අධ්‍යාපන අධිකාරිය අතර සම්බන්ධය තහවුරු කිරීමය.
5. අරමුදල් පරිහරණයේදී කාර්යක්‍ෂමතාව සහ ඵලදායිතාව සහතික කිරීමසඳහාඃ අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයේ සහ වෙනත් අරමුදල් කාර්යක්‍ෂමව හා ඵලදායීව පරිහරණය කෙරෙන බව සහතික කිරීමට පාසල් අධීක්ෂණය උපකාරී වේ.
6. පාසල් ප්‍රතීතනය/පිළිගැනීම සඳහාඃ අධ්‍යයන කටයුතු සඳහා නව පාසලක සූදානම තක්සේරු කිරීම සඳහා පාසල් අධීක්ෂණය සිදු කළ හැකිය. මෙය බොහෝ විට පාසලේ පහසුකම්,සම්පත්, විෂය බාහිර ක්‍රියාකාරකම් සහ ගුරුවරුන්ගේ සුදුසුකම් වැනි දේ පිළිබඳ සමස්ත තක්සේරුවකි. එහි පරමාර්ථය වනුයේ පවතින සම්පත් අධ්‍යාපනික පිරිවිතරයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුකූලද යන්න තහවුරු කර ගැනීමයි.
7. ප්‍රදාන සහ ණය සඳහා නිර්දේශ කිරීමසඳහාඃජාත්‍යන්තර සංවිධාන, පෞද්ගලික ආයතන හෝ ස්වේච්ඡා සංවිධාන වෙතින් පාසල් සඳහා ආධාර ලබා දීමේ දී සුදුසුකම් තක්සේරු කිරීමට හා ඒ සඳහා පාසල් නිර්දේශ කිරීමට පාසල් අධීක්‍ෂණය මගින් මග පෑදේ.
8. පාසලේ සදාචාරාත්මක ස්වරූපය තක්සේරු කිරීමට අධීක්ෂණය මගින් අවස්ථාව සැලසේ.
9. අධ්‍යාපන සැලසුම්කරුවන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රතිපෝෂණය සැපයීම සඳහා

**පාසල් අධීක්ෂණයේ මූලික ලක්‍ෂණ**

ඔස්බර්න් (2012) පාසල් අධීක්ෂණයේ මූලික ලක්‍ෂණ පහක් දක්වා ඇත.

1. සහයෝගීතාව: අධීක්ෂණ කාර්ය මණ්ඩලයට පරිබාහිර අධ්‍යාපන ක්‍රියාවලියේ වෙනත් පාර්ශ්ව අධීක්ෂණ කාර්ය මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කළ යුතු අතර ප්‍රයෝජනවත් සේවාවන් සැපයිය යුතුය. එසේම අධීක්ෂණ ක්‍රියාවලියේ නිරතවන්නන් ද අදාළ පාර්ශ්ව සමග සහයෝගයෙන් කටයුතු කළ යුතුය. අධීක්ෂණය අන්‍යෝන්‍ය ක්‍රියාවලියක් වන බැවින් සියලු දෙනාගේම සහයෝගීතාවෙන් තොරව පාසල් අධීක්‍ෂණයේ අරමුණු සාධනය කිරීම කළ නොහැකිය.
2. ඒකාබද්ධතාව: අරමුණුඉටු කර ගැනීමේදී කාලය, ශ්‍රමය හා සම්පත් නාස්ති වීම වැළැක්වීම සඳහා පාසලේ සියලුම ඒකක එක අරමුණක් සඳහා එකම දිශාවකට ගමන් කිරීම සහතික කිරීමේ ඒකායන අරමුණක් අධීක්‍ෂණයට ඇත. මෙයින් ගම්‍ය වන්නේ පාසල් අධීක්ෂණය මගින් විවිධ පාසල් සංරචක සහ ඒකකවල අරමුණු මධ්‍යම පාසල් ඉලක්ක හා අරමුණු වෙත දිශාගත කිරීමට උත්සාහ කරන බවයි.
3. විද්‍යාත්මක බව: අධීක්‍ෂණය ඉතා පරිස්සමින්සැලසුම් කළයුතුය.
4. නම්‍යශීලීබව: පාසල් අධීක්ෂණය නම්‍යශීලී විය යුතු අතර සාම්ප්‍රදායික නිරීක්ෂණ මෙන් දැඩි නොවිය යුතුය. එය අනාගත වෙනස්වීම් සහ නව තත්වයන්ට සුදුසු විය යුතුය.
5. ස්ථාවර බව: පාසල් අධීක්‍ෂණයට බාධා ඇති නොවිය යුතු අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී සිටින අය දිරිමත් කළ යුතුය.

### අධීක්ෂකවරයා

ඔගුන්සාජුට (1988) අනුව අධීක්ෂකවරයෙකු යනු යම් වැඩ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී වැඩසටහන සහ එය ක්‍රියාත්මක කරන්නන් අතර සිටින මැදිහත්කරුවකු වේ. ඊයා සහලෙනාඩ් (2012)ට අනුව ගුරු නිපුණතා වැඩිදියුණු කර ගැනීමට උපකාර කිරීමේ කර්තව්‍ය අධීක්ෂකවරයෙකුට පැවරේ. හසි (2004) සහ බාහු (2012) සඳහන් කරන පරිදි ගුරුමණ්ඩලයේ සාමාජිකයන්ගේ වැඩකටයුතු මෙහෙයවීම හා ඔවුන්ට මග පෙන්වීම සඳහා වගකීම පැවරෙන සහතිකලත් පුද්ගලයකු ලෙස අධීක්ෂකවරයා අර්ථ දැක්විය හැකිය.



එමනිසා වෘත්තිමය උපදෙස් ලබා දීම මගින් ගුරුවරුන්ට සහාය වීම සහ ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා උපකාර කිරීමේ වගකීම අධීක්ෂකවරයාට පැවරේ.

ඉහත සඳහන් කරුණු අනුව, පාසැලේදී තම කාර්යය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ගුරුවරුන්ගේ කුසලතා වැඩිදියුණු කිරීමේ හා ගොඩනැගීමේ අරමුණින් ගුරුවරුන්ට විශේෂිත තාක්‍ෂණික උදව් සහ උපදෙස් ලබා දීමට උසස් පළපුරුද්දක් ඇති හා වෘත්තීයමය වශයෙන් පුහුණුව ලැබූ පුද්ගලයෙකු  අධීක්ෂකයෙකු ලෙස හැඳින්විය හැකිය.

### හොඳ අධීක්ෂකවරයෙකුගේ ගුණාංග

ඔලුරොන්ෆෙමි (2008) හොඳ පාසල් අධීක්ෂකවරයෙකුගේ ගුණාංග පහත පරිදි ඉදිරිපත් කර ඇත.

1) ඔහුට ප්‍රමාණවත් ශක්තියක් හා යහපත් සෞඛ්‍යයක් තිබිය යුතුය
2) ඔහුට හොඳ නායකත්ව ශෛලියක් තිබිය යුතුය
3) මිනිසුන් සමග සුහදව කටයුතු කිරීමේ හැකියාව ඔහුට තිබිය යුතුය
4) ඔහුට හොඳ දැනුමක් තිබිය යුතුය
5) ඔහු කළමනාකරණය කෙරෙහි ධනාත්මක ආකල්ප වර්ධනය කර ගත යුතුය
6) ඔහුට හොඳ සන්නිවේදන කුසලතා තිබිය යුතුය

ඔගුන්සාජු (1988) ද හොඳ අධීක්ෂකවරයෙකුගේ ලක්ෂණ කිහිපයක් ඉදිරිපත් කර ඇත.

1) ඔහු අවංක, සාධාරණ හා ස්ථිර ඇති අයෙක් විය යුතුය
2) ඔහු විවෘත හා ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයෙක් විය යුතුය
3) ඔහු සමීපව කටයුතු කළ හැකි පුද්ගලයෙක් විය යුතුය
4) ඔහු නිර්මාණාත්මක, හා නව්‍ය අදහස් ඇති අයෙක් විය යුතුය
5) ඔහු හොඳ සවන්දෙන්නෙක් සහ නිරීක්‍ෂකයෙක්විය යුතුය

6) ඔහු ගුරුවරුන් සහ අන් අය සමඟ කටයුතු කිරීමේදී මිත්‍රශීලී, ආචාරශීලී හා ස්ථාවර අදහස් ඇති අයෙක් විය යුතුය

7) ඔහු පහසුකම් සපයන්නෙකු (සුසාධ්‍යකරුවකු)විය යුතුය

**අධීක්ෂකයෙකුට අවශ්‍ය අධීක්ෂණ කුසලතා**

අධීක්ෂණ කුසලතා යනු අධීක්ෂකයෙකු තම යුතුකම් හා වගකීම් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා තිබිය යුතු කුසලතා හෝ නිපුණතා ය. මෙම නිපුණතා තාක්‍ෂණික, කළමනාකරණ සහ මානව සම්බන්ධතා කුසලතාවන්ගෙන් සමන්විත බව පජාක් (2009) නිරීක්ෂණය කළේය. ඒ අනුව අධීක්‍ෂකවරුන් සතුව තිබිය යුතු අධීක්ෂණ කුසලතා දොළහක් (12)ඔහු විසින් පෙන්වා දී ඇත.

1) ප්‍රජා සබඳතාः හොඳ අධීක්‍ෂකයෙකුට පාසල සහ ප්‍රජාව අතර යහපත් හා ඵලදායී සබඳතා ඇති කිරීමට හැකි විය යුතුය

2) කාර්ය මණ්ඩල සංවර්ධනයः ගුරුවරුන්ගේ වෘත්තීය දියුණුවට පහසුකම් සැලසීම සඳහා අධීක්‍ෂකයෙකුට අවශ්‍ය කුසලතා තිබිය යුතුය

3) සැලසුම් කිරීම සහ වෙනස් කිරීමः පාසලේ අඛණ්ඩ සංවර්ධනය සඳහා අවශ්‍ය නවෝත්පාදන සැලසුම් කිරීමට හා ආරම්භ කිරීමට අවශ්‍ය විභවතාව අධීක්‍ෂකයෙකුටතිබිය යුතුය

4) සන්නිවේදනයः අධීක්ෂකවරයාට ඵලදායී හා හොඳ සන්නිවේදන හැකියාවක් තිබිය යුතුය

5) විෂයමාලාවः ඵලදායී ලෙස විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා විෂයමාලාව සකස් කිරීම, විෂයමාලාසම්බන්ධීකරණය හා ඒකාබද්ධ කිරීම පිළිබඳව දැනුමක් අධීක්ෂකවරයාටතිබිය යුතුය

6) උපදේශන වැඩ සටහන්ः ගුරු උපදේශන වැඩ සටහන් වැඩි දියුණු කිරීම සඳහා සහයෝගය හා සම්බන්ධීකරණය කිරීමේ හැකියාව තිබිය යුතුය

7) ගැටලු විසඳීම සහ තීරණ ගැනීමේ කුසලතාः ගුරුවරුන්මුහුණපාන දුෂ්කරතා විසඳීමට හා ඒවා විසඳාගැනීමට හැකිවන පරිදි ඔවුන්ට මග පෙන්වීම පිණිස අධීක්ෂකවරයාට ගැටලු විසඳීම සහ තීරණ ගැනීමේ කුසලතාතිබිය යුතුය



8) පර්යේෂණ හා වැඩ සටහන් ඇගයීමේ කුසලතාවः අධීක්‍ෂකයෙකුට හොඳ පර්යේෂණ කුසලතාවක් තිබිය යුතු යැයි අපේක්‍ෂා කෙරෙන අතර එමගින් ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සහ ගුරු වෘත්තියේ භාවිතයන් පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය නායකත්වය සැපයිය හැකිය. ඊට අමතරව, පාසලේ වැඩ සටහන් වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන්ට සහ පරිපාලකයන්ට අවශ්‍ය මගපෙන්වීම ලබා දීමටත් පාසලේ ක්‍රියාත්මකවන වැඩ සටහන්වල ශක්තීන් හා දුර්වලතා විවේචනාත්මකව තක්සේරු කිරීමටත් අධීක්ෂකවරයාට ඇගයීම් කුසලතා තිබිය යුතුය.

9) නිරීක්‍ෂණයः පන්ති කාමර නිරීක්‍ෂණය මත පදනම්ව ගුරුවරුන්ට සාධාරණ ප්‍රතිපෝෂණ ලබා දීම සඳහා හොඳ නිරීක්‍ෂණ කුසලතා තිබිය යුතු යැයි අපේක්‍ෂා කෙරේ.

10) අභිප්‍රේරණය සහ සංවිධානය කිරීමः පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ගුරුවරුන් අභිප්‍රේරණය කිරීමට අවශ්‍ය නිපුණතා අධීක්ෂකවරයා සතු විය යුතුය

11) පුද්ගලික සංවර්ධනයः මෙම කුසලතාව අධීක්ෂකවරයාට එක් එක් ගුරුවරුන්ගේ පෞද්ගලික හා වෘත්තීය නිපුණතා ඔප්නැංවීමට කිරීමට උපකාරී වේ.

12) ගුරුවරුන්ට පහසුකම් සැපයීමः අධීක්ෂකවරයා ගුරුවරුන්ගේ ඉගැන්වීම් සහ ඉගෙනීම් කටයුතු සඳහා තාක්ෂණික ආධාර සැපයිය යුතුය.

පාසල් අධීක්‍ෂණ විධික්‍රම

ජියෝබා (2006) සහ එසියුසෝ (2016) පාසල් අධීක්ෂණයේ ප්‍රධාන වර්ග දෙකක් හඳුන්වා දී තිබේ.

1. අභ්‍යන්තර අධීක්ෂණය

2. බාහිර අධීක්ෂණය

**අභ්‍යන්තර අධීක්ෂණයः** මෙය පාසල් කාර්ය මණ්ඩලයට අධීක්ෂණ සේවා සැපයීම සඳහා එම පාසලේ ම අභ්‍යන්තර මාණ්ඩලික සාමාජිකයන් යොදා ගන්නා අධීක්ෂණ ආකාරයකි. මෙම අධීක්ෂණ ක්‍රමය සාමාන්‍යයෙන් පාසලක දෛනික පරිපාලනයේ අංගයක් වන

අතර, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය තම රාජකාරිය කාර්යක්‍ෂමව හා ඵලදායීව ඉටුකරන වන බව සහතික කරයි. අභ්‍යන්තර අධීක්ෂණය විදුහල්පති, නියෝජ්‍ය හෝ උප විදුහල්පතිවරුන්, අංශ ප්‍රධානීන් සහ විදුහල්පති විසින් පත් කරන ලද අනෙකුත් ජ්‍යෙෂ්ඨ හා පළපුරුදු ගුරුවරුන් මඟින් සිදු කෙරේ.

**බාහිර අධීක්ෂණය:** බාහිර අධීක්ෂණය යනු පාසලට බාහිර වශයෙන් පැමිණ කරනු ලබන අධීක්ෂණයයි. මේ සඳහා පාසල් පරිපාලන නියෝජිතයන් කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි වශයෙන් පැමිණ අධීක්ෂණය සිදු කරයි. ශ්‍රී ලංකාවේ බාහිර අධීක්ෂණය පහත පරිදි මට්ටම් කිහිපයකින් සිදු කෙරේ.

1. කොට්ඨාස මට්ටමේ අධීක්ෂණය
2. කලාප මට්ටමේ අධීක්ෂණය
3. පළාත් මට්ටමේ අධීක්ෂණය
4. ජාතික මට්ටමේ අධීක්ෂණය (රේඛීය අමාත්‍යාංශය)

මෙසේ බාහිර හෝ අභ්‍යන්තර වශයෙන් සිදු කරනු ලබන පාසල් අධීක්ෂණයේ අරමුණු අනුව පහත පරිදි නැවත වර්ගීකරණය කළ හැකිය.

## පූර්ණ පරීක්‍ෂණය: Full Inspection

පූර්ණ පරීක්‍ෂණය යනු පරීක්‍ෂක කණ්ඩායමක් පාසලකට පැමිණ පාසලේ සෑම පැතිකඩක් ම පරීක්‍ෂා කිරීම සඳහා වන අධීක්‍ෂණයකි **(අඩෙනිජි, (2009)**. මෙයට අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, විෂයමාලාව, පාසලේ සියලු වාර්තා, උපකරණ, පාසල් පිරියත සහ පාසලේ සමස්ත සංවිධානය යනාදිය ඇතුළත් වේ. පූර්ණ පරීක්‍ෂණ අධීක්ෂණයක දී පාසලෙහි ක්‍රියාත්මක විෂයමාලාවේ කාර්ය සාධන මට්ටම දැන ගැනීම සඳහා අධීක්ෂණය ක්‍රියාත්මක කෙරේ **(Eziuzo, 2016)**. එග්බෙබි සහ හර්බාවු (2019) පූර්ණ පරීක්‍ෂණයේදී විමසා බැලිය යුතු කරුණු කිහිපයක් දක්වා ඇත.

1. පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඇතිභෞතික පහසුකම් සහ උපකරණවල ප්‍රමාණවත් බව සහ අදාළ බව



2. ශිෂ්‍යයන්ගේ සාධනය පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරකම් හා වැඩ නිරීක්ෂණය කිරීම
3. ගුරුවරුන්ගේ ඉගැන්වීම් කටයුතු
4. පාසලේ සියලු වාර්තා
5. කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව සහ ප්‍රමාණාත්මක බව
6. පාසලේ සාමාන්‍ය පරිපාලනය ඇගයීම

පූර්ණ අධීක්ෂණයක් සම්පූර්ණ දවසක් හෝ සතියක් දක්වා දීර්ඝ විය හැකිය. අධීක්ෂකවරු අධීක්ෂණයෙන් අනතුරුව පාසලේ සමස්ත ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තාවක් සකස් කොට පාසලෙහි සමස්ත සාධනය පිළිබඳව පාසලෙහි කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කරති. එහිදී කළමනාකරණයෙහි ධනාත්මක සහ සකස්විය යුතු සියලු පැතිකඩ සාකච්ඡා කෙරෙන අතර අවසානයේදී පාසලෙහි සමස්ත කාර්ය මණ්ඩලය දැනුමවත් කිරීම ද සිදුවේ. එග්බෙබි සහ හර්බව් (2019) පෙන්වා දෙන්නේ සමාන්‍යයෙන් පාසලක වසර (3-5) කට වරක් මෙවැනි පූර්ණ පරීක්‍ෂණයක් සිදු කළ යුතු බවයි.

## නිතිපතා පරීක්‍ෂා කිරීම: Routine Inspection

මෙය පාසලේ එදිනෙදා කටයුතු සොයාබැලීමට පරීක්‍ෂකවරුන් හුරු කිරීමේ අරමුණ ඇතිව කෙටි කාලසීමාඅතර පාසල් පරිශ්‍රයෙහි සිදුවන නිරීක්ෂණයකි. මේ ආකාරයේ අධීක්‍ෂණයකදී, අධීක්‍ෂකවරයා විධිමත් වාර්තාවක් සකසන්නේ නැත, එය හුදු නිරීක්ෂණයක් පමණක් වන අතර, එහි දීකාර්ය මණ්ඩලයේ තත්ත්වය, කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ පැමිණීමේ වාර්තා, අනෙකුත් පාසල් වාර්තා, පුස්තකාලය, විද්‍යාගාරය, සහ තාක්‍ෂණ අංශ වැනි භෞතික පහසුකම් සහ එදිනෙදා පාසලේ ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කර කෙටි වාචික අදහස් දැක්වීමක් කළ හැකිය.

## පසු විපරම් පරීක්‍ෂණය: Follow-Up Inspection

පූර්ණ පරීක්‍ෂා කිරීමේ අධීක්‍ෂණයක දී අධීක්‍ෂක (වරුන්ගේ) වාර්තාවේ ඉදිරිපත් කර ඇති නිර්දේශ හා යෝජනා මත ගත් ක්‍රියාමාර්ග තක්සේරු කිරීම සඳහා මෙවැනි අධීක්‍ෂණයක් සිදු කරන බව එක්සියුසෝ (2016) සඳහන් කරයි. මේ ආකාරයේ අධීක්‍ෂණයක දී අවධානය යොමු කෙරෙන්නේ පෙර නිර්දේශයන්ගෙන් පාසලට ඇති

බලපෑම සෙවීමට සහ එය ක්‍රියාත්මක කිරීමෙන් ධනාත්මක ප්‍රතිඵල ලැබෙනවාද යන්න සෙවීම සඳහා ය. මේ ආකාරයේ අධීක්‍ෂණයක දී පරීක්‍ෂකවරයා පෙර නිර්දේශවලට අනුව ගුරුවරයාගේ ශක්‍යතා මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා තවදුරටත් උපදෙස් ලබා දෙයි.

## අර්ධ පරීක්‍ෂණය (Partial Inspection

මෙම අධීක්ෂණ ක්‍රමය සීමාසහිත අධීක්ෂණ ක්‍රමයකි. මෙහිදී අනෙකුත් අධීක්ෂණ ක්‍රම මෙන් පාසලෙහි සමස්ත පැතිකඩ ම අධ්‍යයනය නොකෙරේ. එසේම අධීක්ෂණය සඳහා අධීක්ෂණ කණ්ඩායම්ක් පාසලට නොපැමිනෙන අතර අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඉහළ අධ්‍යාපන නිලධාරියෙකු පාසලට පැමිණ පාසලෙහි අවධානය යොමු විය යුතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, ශුභසාධනය, කළමනාකරණය හෝ වෙනත් අංශයක් පිළිබඳව පමණක් අධීක්ෂණ කාර්යයෙහි නිරත වේ.

## සහතික පරීක්‍ෂණය: Certificate Inspection:

මෙවැනි වර්ගයේ අධීක්ෂණ සිදු සිදු කරනු ලබන්නේ යම් කිසි ගුරුවරයෙකු උසස් වීමක් ලැබීමට හෝ සිය පරිවාස කාලය අවසන් කළ විට අදාළ ඊළඟ ශ්‍රේණියේ පිහිටුවීම් පිණිස සුදුසුකම් සපුරා ඇද්ද යන්න යන්න පරික්ෂා කිරීම සඳහාය (එක්සියුසෝ, 2016).

## විශේෂ විමර්ශන සංචාරය:Special Investigation Visit:

පාසලක විනය, මූල්‍ය හෝ අධ්‍යාපනය වැනි කාරණා සම්බන්ධව වෘත්තීය විෂමාචාර වාර්තා වීමක දීසාමාන්‍යයෙන් මෙවැනි අධීක්ෂණයක් සිදු කරන බව එග්බේබි සහ හර්බච් ((2019)) පෙන්වා දෙති. බරපතල තත්වයේ ශිෂ්‍ය ආරවුල්, පරිපාලනමය හෝ කළමනාකරණමය විෂමාචාර, පාසල් අරමුදල් අවභාවිතය, දූෂණය, කැරලි කෝලාහල සහ ස්ත්‍රී දූෂණ හා අපචාර, සංස්කෘතික හා වෙනත් සමාජ විරෝධී ක්‍රියාකාරකම් ආදි බාහිර කණ්ඩායමක් හරහා විමර්ශනය කළ යුතු සිද්ධීන් මෙයට ඇතුළත් වේ. මේවැනි අවස්ථාවක අධ්‍යාපන බලධාරීන්ට අමතරව නෛතික වශයෙන් බලය පැවැරෙන රජයේ සුදුසු වෙනත් ආයතනයකට ද අධීක්ෂණ සහභාගිත්වය ලබා දෙනු ඇත.



## ගුරු අධීක්ෂණ විධික්‍රම

පාසල් අධීක්ෂණයේදී වැඩි අවධානයක් යොමු වන්නේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ය. එහිදී ගුරු සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු වේ. ගුරුවරයා යනු වෘත්තිකයෙකි. එහෙයින් ගුරු අධීක්ෂණය වෘත්තීය ප්‍රවේශයකින් සිදුවිය යුතුය. එසේ ගුරුවරයා අධීක්ෂණය කළ හැකි අධීක්ෂණ වර්ග කිහිපයකි.

### 01. නිවැරදි කිරීමේ අධීක්‍ෂණ විධිය

මෙය ස්වභාවයෙන්ම ප්‍රතිෂේධාත්මකය. අධීක්‍ෂකයා පාසල සොයා ගොස් ගුරුවරයාගේ වැරදි සොයයි. සමස්ත අධීක්‍ෂණ කාලයේම සිදුකරනුයේ ගුරුවරයාගේ වැරදි අඩුපාඩු දුබලතා සොයා බැලීමයි. ඔහුගේ එකම අරමුණ තමා හරි යැයි සිතා ඒ අනුව ගුරුවරයාගේ අඩුපාඩු නිවැරදි කිරීමයි. මෙහිදී විදුහල්පති, ගුරුවරු ඇතුළු සෑම අයකුගේම වැරදි සොයා ලොග් සටහනේ පවා ලියයි. මෙම සම්ප්‍රදායික ක්‍රමවේදයේ දී අධීක්‍ෂණයට භාජනය වන අධීක්‍ෂිතයාගේ අභිමානයට සහ ගෞරවයට හානියක් වේ. එබැවින් මෙම ක්‍රමය අධීක්‍ෂණ ක්‍රියාවලියේ දී කිසිසේත් ම භාවිතයට නොගත යුතු බව දැක් වේ.

### 02. වැරදි වැළැක්වීමේ අධීක්‍ෂණ විධිය

මෙම අධීක්‍ෂණ ක්‍රියාවලියේදී අධීක්‍ෂකවරයා ගුරුවරයා හා විදුහල්පතිවරයා මුහුණ දෙන යම් යම්ගැටලු ස්ව අත්දැකීමෙන් හා බුද්ධියෙන් අබෝධ කරගෙන ඒවා වැළැක්වීමට සහාය වේ. මෙම අධීක්‍ෂණක්‍රියාවලිය නිවැරදි කිරිමේ අධීක්‍ෂණ විධියට වඩා ගුරුවරුන්ට ප්‍රයෝජනවත්වේ.

### 03. නිර්මාණාත්මක අධීක්‍ෂණ විධිය

මෙහි දී අධීක්‍ෂකයා අධීක්‍ෂණ ක්‍රියාවලියේද අධීක්‍ෂිතයාට සහය දැක්වීම සිදුවේ. හිතෛෂීභාවය තහවුරු කරයි. තමා ඉහළ පුද්ලයෙකු හෝ ලොක්කෙකු යැයි කිසිවිටත් මානයෙන් නොසිතා ගුරුවරයා නොපෙළයි. මෙනිසා ගුරුවරයා සමීප බව මතහටගත් විශ්වාසය හේතුවෙන් තමාට ඇති දුෂ්කරතා අධීක්‍ෂකවරයාට කියයි. ඉන්පසු එවාට පිළියම් දෙනු ලබයි. මෙහිදී අධීක්‍ෂකයා සම්පත් දායකයෙකු සේ ගුරුවරුන්ව ප්‍රබෝධමත් කරයි.

## 04. සායනික අධීක්‍ෂණය

සායනික අධීක්‍ෂණය ද නිර්මාණාත්මක අධීක්‍ෂණ විධිය මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී අධීක්‍ෂණ ක්‍රියාවලියකි. සායනික අධීක්ෂණයේ දී සිදු වනුයේ අධීක්ෂකවරයා සහ අධීක්ෂණයට ලක් වන්නා අධීක්ෂණයට පෙර, අධීක්ෂණය අතරතුර සහ අධීක්ෂණය අවසන් වූ පසු මනා සුහදත්වයක් සහිතව කටයුතු කිරීමයි. උදාහරණ ලෙස පන්ති කාමර අධීක්ෂණයකදී අධීක්ෂණයට පෙර ගුරුවරයා සහ අධීක්ෂකවරයා යන දෙදෙනාම එකට එකතු වී පාඩම් සටහන් සැලසුම් කළ යුතු ය. එසේ සැලසුම් කරන ලද පාඩම් සටහන් මූලිකකොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකෙරේ. පාඩම ඉගැන්වීමෙන් අනතුරුව අධීක්ෂකවරයා සහගුරුවරයා යනදෙදෙනාම එකතු වී ගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ අඩුපාඩු සහ යහපත් ලක්ෂණ සුහදව සාකච්ඡා කරයි. මෙම ප්‍රවේශයේ දී කිසිම අයුරකින් අධීක්ෂකවරයා ගුරුවරයාට වඩා ඉහළ නිලධාරියෙක් ලෙස හෝ ගුරුවරයාගේ අඩුපාඩු සොයන්නේ ලෙස ක්‍රියාත්මක නොවෙයි.

## සමාලෝචනය

පාසල් අධීක්ෂණය යනු පාසලේ ඵලදායී ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා ගුරු නිපුණතා වැඩිදියුණු කිරීම සහ පාසලේ සමස්ථ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම වෙනුවෙන් අධීක්‍ෂකවරයා සහ ගුරුවරයා/පාසල අතර අන්තර්ක්‍රියාකාරි තාක්‍ෂණික සහයෝගිතා ක්‍රියාවලියක් බව උපකල්පනය කළ හැකිය. ඒ අනුව එකී ක්‍රියාවලිය පාසල් කාර්යමණ්ඩලයේ වෘත්තීයභාවය ඉහළ නැංවීම සහ සමස්ත පාසල් ක්‍රියාවලිය අරමුණු කොටගත් මනාව සැලසුම් කරන ලද වැඩසටහන් සමූහයකින් යුක්ත විය යුතුය. පාසල් අධීක්ෂණය පාසල් කළමනාකරණයෙහි අත්‍යවශ්‍ය අංගයක් වන අතර බාහිර හෝ අභ්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක පාසල් අධීක්ෂණයෙහි ප්‍රධාන වගකීම විදුහල්පතිවරයා සතුය.



## ආශ්‍රිත ග්‍රන්ථ


Adeniji, A. I. (2009). **Perspectives in educational management.** Lagos: Elegant Publishing Company Limited.

Amadi, M. N. (2014). Organization and management of schools in Nigeria: Past and present. Lagos: Vitman Educational Books

Chike-Okoli, A. (2016).**Application of supervisory techniques.** In C. C. Uchendu & B. A. Basil (Eds.). Educational management: A guide for practitioners (pp. 218-245). Calabar: University of Calabar Printing Press.

Egbebi, J. O. & Harbau, M. I. (2019). **Essentials of educational inspection-supervision and planning in the era of globalization**. Zaria: Dolphin Press.

Eya, P. E. & Leonard, C. C. (2012). **Effective supervision of instruction in Nigerian secondary schools: Issues in quality assurance.** Journal of quality education, 8(1)

Eziuzo, G. O. (2014). **Secondary school administration and supervision**. In G. O. Unachukwu & P. N. Okorji (Eds.). Educational management: A skill building approach. (pp.385-400). Nimo: Rex Charles & Patrick Ltd.

Federal Ministry of Education (2001). **Inspectors' manual. Retrieved from http://www.nti=nigeria.org/org/nti-pgde-25.pdf**

Kalule, & Bouchamma, Y. (2013). Teachers' supervision: What do teachers think? EBSCO journal. 40(1), 24-56.

Mbiti, D. M. (1974). **Foundations of school administration.** East Africa: Oxford University Press.

National Open University. (2019). **Edu 810: Supervision of instruction in education. Lecture notes compiled by Mobolaji Ogunsanya** (eds.)/ NOUN. Retrieved June, 2020.

Nikam, R. (2010). Educational administration. New Delhi: Anmol Publishers.

Nwaneri, P. N. & Ikwuegbu, P. N. (2016). **Leadership challenge in inspection and supervision.** In S. O, Oluwuo; V. C. Onyeike & J. D. Asodike (Edt) Supervision and inspection in schools for productivity: emerging perspectives (Pp.110-124). Port Harcourt: Pearls publishers international Ltd.

Ogunsaju, S. (1988). **Educational supervision: perspectives and practices in Nigeria.** Ile-Ife: University of Ife press.

Ogunu, M. (2000). **Introduction to educational management. Benin City: Ambik Press.**

Okorji, P. N. & Unachukwu, G. O. (2014). Educational administration and management: An overview. In G. O. Unachukwu &P. N. Okorji (Eds.). Educational management: A skill building approach. (pp.1-11). Nimo: Rex Charles & Patrick Ltd.

Onyeike, V. C. (2016). **Supervision and organizational change for productivity** (P. 1-15). In S. O, Oluwuo; V. C. Onyeike & J. D. Asodike (Edt) Supervision and inspection in schools for productivity: emerging perspectives. Port Harcourt: Pearls publishers international Ltd.

Peretomode, V. F. (2012). Theories of management: Implications for educational administration. Benin City: Justice Jeco.

Uchendu, C.C. & Akuegwu, B. A. (2016). Educational management: An overview. In C.C.Uchendu & B. A. Basil (Eds.). Educational management: A guide for practitioners (pp. 1-15) Calabar: University of Calabar Printing Press.